

# 2. අසිරිමත් මැවිල්ල

අහස පොළොව මැවුවේ කවු ද?
ඉර හඳ තරු මැවුවේ කවු ද?
ඇළ දොළ ගං මැවුවේ කවු ද?
ගස් වැල් මල් මැවුවේ කවු ද?

කැලේ සතුන් මැවුවේ කවු ද?
මුහුදේ මාළු මැවුවේ කවු ද?
කුරුලු රංචු මැවුවේ කවු ද?
මේ සැමදේ මැවුවේ කවු ද?

පැවරුම

1. කණ්ඩායමක් වශයෙන් කිහිප දෙනෙක් එකතු වී දිනපතා ගුරු මේසයට මල් බඳුනක් පිළියෙල කරන්න.
2. අප වෙනුවෙන් දෙවි පියා මැවූ දේවල් පහක් ලියන්න.

කඳුවැටි හෙල් මැවුවේ කවු ද?
නිල් තණ බිම් මැවුවේ කවු ද?
මහා සාගර මැවුවේ කවු ද?
සොබා දහම මැවුවේ කවු ද?

මේ සියල්ල මැවුවේ දෙවි පියා
මිනිස් අපව මැවුවේ දෙවි පියා
මෙලොව අපට දුන්නේ දෙවි පියා
අපට ඉන්න එක ම දෙවි පියා

**දෙවියන් වහන්සේ අහසත් පොළොවත්**
**එහි ඇති සියලු දේත් මැවූ සේක.**

